# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2026.07.27


| | | |
|---|---|---|
| පැමිණිලිකාර පාර්ශවය | : | එම්.රත්නපාල මයා,<br>92 බී,<br>බාලිකා පාර,<br>මතුගම. |
| වගඋත්තරකාර පාර්ශවය | : | අධ්‍යක්ෂ ජනරාල්,<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,<br>පේරාදෙණිය. |

<u>**පැමිණිලි අංකය : එච්ආර්සී/4372/24**</u>

**පැමිණිල්ල**

ඉහත පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සදහන් කර ඇත්තේ, ඔහු ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ 111 වන ශ්‍රේණියේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුර සදහා බදවා ගැනීමේ ලිඛිත විභාගයට පෙනී සිට එකී විභාගයෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි නමුත් එකී තනතුර සදහා ඔහු බදවා ගෙන නොමැති බවයි. 1988.08.18 දිනැතිව අංක 27/88 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ආබාධිත පුද්ගලයින් සදහා 3 % ක ප්‍රතිශතයක් ඇබෑර්තු වලින් ලබා දියයුතු බවට සදහන්ව තිබුණද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ආබාධිත පුද්ගලයින් සදහා එවැනි අවස්ථාවක් ලබා නොදීම තුළින් පැමිණිලිකරු ඇතුලු රැකියාවට සුදුසු ආබාධිත සහිත පුද්ගලයින්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවත් ඒ අනුව උක්ත චක්‍රලේඛයේ සදහන් පරිදි පැමිණිලිකරු ඇතුළු සුදුසුකම් ලබන ආබාධිත සහිත පුද්ගලයින් සදහා අදාළ තනතුර ලබා ගැනීමටත් මින් ඉදිරියට රාජ්‍ය සේවයේ සහ රාජ්‍ය සංස්ථාවන්හි පුරප්පාඩු සදහා බදවා ගැනීමේදී රාජ්‍ය පරිපාලන


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04. / இல. 14, ஆர். ஏ. த. மெல் மாவத்தை, கொழும்பு 04. / No. 14, R. A. De Mel Mawatha, Colombo 04.

සභාපති / தவிசாளர் / Chairman: 011 - 250 5451

ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 250 5541/74

ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com

දුරකථනය / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82

ලේකම් / செயலாளர் / Secretary: 011 - 250 5521

ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996

වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

චක්‍රලේඛ අංක 27/88 දරණ චක්‍රලේඛයේ සදහන් විධිවිධාන සළකා බලා කටයුතු කිරීමට අදාළව නිර්දේශයක් ලබා දෙන ලෙසට ඉල්ලා ඇත.

<u>**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :**</u>

මෙම පැමිණිල්ල සම්බන්ධව වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම කොමිෂන් සභාව වෙත වාර්තා කර ඇත්තේ, පැමිණිලිකරු විසින් සදහන් කර සිටින තනතුර වන කෘෂිකර්ම සේවයේ 111 ශ්‍රේණියේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂක (සංවර්ධන) තනතුර සදහා 2021.12.03 දිනැති අංක 2759 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද ගැසට් නිවේදනය මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් කැදවීමෙන් අනතුරුව ලිඛිත තරග විභාගයක් පැවැත්වූ බවත් එකී විභාගයෙන් සුදුසුකම් ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සදහා කැදවූ බවත් ය.

තවද, ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ සියලු බදවා ගැනීම් අංක 1880/26 දරණ 2014.09.14 දිනැති ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව සිදු කරනු ලබන බවත් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය ඇතුළු අනෙකුත් කිසිදු දීප ව්‍යාප්ත සේවාවක රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 හි සදහන් පරිදි ආබාධිත පුද්ගලයින් 3% ක ප්‍රතිශතයක් බදවා ගැනීමට අදාළ කිසිදු නිර්නායකයක් ඇතුළත් කර නොමැති බවත් කරුණු ඉදිරිපත් කර ඇත.

තවද, ඉහත පැමිණිලිකරු විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබූ අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර තිබූ නමුත් මෙම පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව නියමිත ලකුණු ලබා නොතිබීම හේතුවෙන් ඔහුගේ අභියාචනා ප්‍රතික්ෂේප කළ බවත් තවදුරටත් දන්වා ඇත.

<u>**කොමිෂන් සභාවේ නිරීක්ෂණය :**</u>

වගඋත්තරකාර ආයතනය ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ 111 වන ශ්‍රේණියට බදවා ගැනීම සදහා අයදුම්පත්‍ර කැදවීමට 2021.12.03 දිනැති අංක 2259 දරණ ගැසට් පත්‍රයේ දැන්වීමක් පල කර ඇති අතර ඒ සදහා මෙම පැමිණිලිකරු අයදුම් කර ලිඛිත තරග විභාගයෙන් සමත් වී සම්මුඛ පරීක්ෂණය සදහා ද පෙනී සිට ඇති නමුත් ලකුණු ප්‍රමාණවත් නොවීම මත එකී තනතුර සදහා තේරී පත්ව නොමැති බවට නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ලේ සදහන් කර තිබෙන්නේ 1988.08.18 දිනැති අංක 27/88 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සදහන් විධිවිධාන අනුව ආබාධිත සහිත පුද්ගලයින්ට රැකියා සැපයීමේදී ඇබෑර්තු වලින් 3% ක් අවශ්‍ය සුදුසුකම් ලත් හා ආබාධිත සහිත පුද්ගලයින් සදහා ලබා දියයුතු

බවට සදහන්ව තිබියදී ඉහත වගඋත්තරකාර පාර්ශවය ආබාධිත පුද්ගලයින් සදහා එවැනි අවස්ථාවක් ලබා නොදී තිබුණු බවයි.

ඉහත කී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 හි සදහන් කර තිබෙන්නේ " රාජ්‍ය සේවයේ සහ රාජ්‍ය සංස්ථාවන්හි ඇබෑර්තු පිරවීමේ දී,

(1) එවැනි ඇබෑර්තු වලින් 3 % (සියයට තුනක්) අවශ්‍ය සුදුසුකම් ලත් හා ආයතනික තත්වය ඔවුන්ගේ කටයුතු වලට බාධාවක් නොවන ආබාධිත පුද්ගලයින්ගෙන් පිරවිය යුතු ය.

(2) තවද ඔවුන් බදවා ගැනිමේ දී ද අනුමත බදවා ගැනීමේ පටිපාටි/ සේවා ව්‍යවස්ථා අනුගමනය කළ යුතුයි."

යනුවෙන් වේ.

ඉහත කී උපවගන්ති (1) සළකා බැලීමේ දී මෙම පැමිණිල්ලේ වගඋත්තරකාර පාර්ශවය රාජ්‍ය සේවයට අයත් පාර්ශවයක් බව පැහැදිලි කරුණකි. එහෙයින් ඉහත වගඋත්තරකාර පාර්ශවය එකී ආයතනයේ පවතින ඇබෑර්තු පිරවීමේදී ඉහත සදහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 අනුව කටයුතු කිරීම අනිවාර්ය බවට නිරීක්ෂණය වේ. එහෙත් මෙම වගඋත්තරකාර පාර්ශවය විසින් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය ඇතුළු අනෙකුත් කිසිදු දීපව්‍යාප්ත සේවාවක ඉහත සදහන් චක්‍රලේඛය අනුව කටයුතු නොකරන බව මෙම කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

තවද, පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද අභියාචනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති නමුත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2024.11.11 දිනැති ලිපිය මගින් ඉහත පැමිණිලිකරු ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුව නියමිත ලකුණු ලබා නොතිබීම හේතුවෙන් ඔහුගේ අභියාචනය ප්‍රතික්ෂේප කිරීමට එම කොමිෂන් සභාව තීරණය කර ඇති බව දන්වා තිබෙන බවට එම ලිපිය මගින් පෙනී යයි.

පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කරමින් සදහන් කර සිටින්නේ පැමිණිලිකරු වෙත ප්‍රදානය කර ඇති ලකුණු ප්‍රමාණවත් නොවන බවට හෝ පැමිණිලිකරු ඉහත තනතුර සදහා තේරීපත් නොවීම හේතුවෙන් හෝ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවට නොවන අතර ඉහත වගඋත්තරකාර පාර්ශවය විසින් උක්ත තනතුර සදහා බදවා ගැනීමට කටයුතු කිරීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 හි සදහන් පරිදි බදවා ගැනීමේදී ආබාධිත සහිත පුද්ගලයින් සදහා 3% ක් වෙන් කිරීමට අදාලව කටයුතු කර නොමැති බැවින් මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවයි.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවේ සදහන් කර ඇත්තේ,

*"නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද, සර්ව සාධාරණ විය යුත්තේ ය."*

යනුවෙන් වේ.

තවද, 12(2) ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ,

*"කිසිම පුරවැසියෙකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජන නොවිය යුත්තේය."*

යනුවෙන් වේ.

නමුත් එම ව්‍යවස්ථාවේ 12(4) වන ව්‍යවස්ථාවේ පහත පරිදි සඳහන් කර සිටී.

*"කාන්තාවන්ගේ, ළමයින්ගේ හෝ අබල තැනැත්තන්ගේ ප්‍රගතිය සඳහා නීතියෙන් හෝ අනු නීතිවලින් හෝ විධායක ක්‍රියා මාර්ගයෙන් හෝ විශේෂ විධිවිධාන සැලැස්වීම මේ ව්‍යවස්ථාවෙන් කිසිසේත් අවහිර නොවන්නේ ය."*

යනුවෙන් ය.

ආබාධිත සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ (UN Convention on the Rights of Persons With Disabilities ) අරමුණ වන්නේ සියලුම ආබාධිත සහිත පුද්ගලයින් විසින් සියලුම මානව හිමිකම් සහ මූලික නිදහස පූර්න හා සමානව භුක්ති විඳීම, ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම, සහතික කිරීම සහ ඔවුන්ගේ ආවේනික ගෞරවයට ගරු කිරීම, ප්‍රවර්ධනය කිරීම ලෙසට දක්වා ඇත.

ශ්‍රී ලංකාවේ ආබාධිත සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සඳහා වන මූලික නීති සම්පාදනය වන්නේ 1996 අංක 28 දරණ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත (Protection of the Rights of Persons with Disabilities Act No.28 of 1996) වන අතර එමගින් අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම, ඉදිරියට ගෙන යාම සහ ආරක්ෂා කිරීම වැනි අරමුණු ඇතුළත් කර ඇති අතර මෙම පනත මගින් ආබාධිත සහිත පුද්ගලයින්ට රැකියාව, අධ්‍යාපනය සහ ප්‍රවේශ්‍යතාවයේ වෙනස්කම් කිරීම ද වලක්වා ඇත.

තවද එකී ආබාධිත සහිත පුද්ගලයින් සඳහා වන පනතෙහි 23(1) වගන්තිය ප්‍රකාරව ආබාධ සහිත කිසිඳු තැනැත්තෙකුට යම් සේවා නියුක්තියක හෝ කාර්යාලයක හෝ සේවය සඳහා ගැනීමේ දී හෝ යම් අධ්‍යාපන ආයතනයකට අදාළ කර ගැනීමේදී ඒ ආබාධය හේතුකොටගෙන ඔහු යම් වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොකළ යුතු බව සඳහන් කර ඇත. මෙම පනතේ විධිවිධාන ඉහත කී 12(4) ව්‍යවස්ථාවට අනුකූල බවට පැහැදිලි වේ.

තවද 2006 වර්ෂයේ අංක 1 දරණ ආබාධිත සහිත පුද්ගලයින් (ප්‍රවේශ්‍යතා) රෙගුලාසියක් (Regulation on Disable Persons Accessibility) ඉහත කී පනත යටතේ ගැසට් කර ඇති අතර මෙම රෙගුලාසි මගින් ආබාධිත සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් තවදුරටත් තහවුරු කර ඇත.

ඒ අනුව ඉහත වගඋත්තරකාර පාර්ශවය විසින් ඇබෑර්තු තනතුරු සඳහා බඳවා ගැනීමේදී ඉහත කී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන නොසළකා හැර කටයුතු කර ඇති බවට මෙම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

ඒ අනුව, රාජ්‍ය සේවයේ හා රාජ්‍ය සංස්ථාවක තනතුරු පිරවීමේදී කටයුතු කළයුතු ආකාරය පිළිබඳව නිකුත් කර ඇති ඉහත කී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 දරණ චක්‍රලේඛය මගින් ආබාධිත සහිත පුද්ගලයින්ට , රාජ්‍ය සේවය සහ රාජ්‍ය සංස්ථාවක සේවය කිරීමට ද අවස්ථාවක් ලබා දෙමින් ඉහත අයිතිය තවදුරටත් තහවුරු කර ඇත.

රජය විසින් ජාත්‍යන්තර සම්මුතියකට අත්සන් කර, එය අපරානුමිතිය කළපසු රට තුළ ක්‍රියාත්මක කිරීමේ වගකීමක් පැවරේ. එම වගකීම ක්‍රියාත්මක කළයුතු වන්නේ රාජ්‍ය ආයතනය සහ රජයේ නිලධාරීන් විසින් වන අතර, ඔවුන් විසින් ඊට අනුකූලව පරිපාලන පටිපාටි හා අදාළ සේවා ව්‍යවස්ථා සකස් කිරීම හා එකී අයිතීන් ආරක්ෂා වන පරිදි ක්‍රියාකළයුතුව ඇත. මේ සම්බන්ධව ජාත්‍යන්තර සම්මුතියකට අනුව කටයුතු කළයුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නඩු තීන්දු වලදී පෙන්වා දී ඇත. එම කරුණු නොසළකා වගඋත්තරකරුවන් ක්‍රියා කිරීම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමේ වගකීම ඔවුනට පැවරේ.

> *Weerawansa v. Attorney-General and Others (2000) 1 SLR 387 යන නඩු තීන්දුවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දක්වා ඇත්තේ;*
>
> *''ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(15) ව්‍යවස්ථාව අනුව රජය ජාත්‍යන්තර නීතිය හා සම්මුති වගකීම් පිළිබඳ ගෞරවය වර්ධනය කිරීමට උත්සාහ කළයුතු ය යනුවෙන් දක්වා ඇති බැවින් රජය තම ජාත්‍යන්තර සම්මුති වගකීම් රට තුළද ගරු කළයුතු බවයි.''*

එමගින් අධිකරණය තීරණය කර ඇත්තේ පුද්ගලයාගේ නිදහස හා මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් ජාත්‍යන්තර නීතිය යටතේ සපයන ආරක්ෂාවන් පුරවැසියන්ට ප්‍රයෝජනවත් වන පරිදි යොදා ගතයුතු බවයි.ඉහත සඳහන් කරුණු වලට අනුව ඉහත කී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 හි සඳහන් විධිවිධාන පැහැර හරිමින් උක්ත වගඋත්තරකාර පාර්ශවය විසින් කටයුතු කිරීම හේතුවෙන් පැමිණිල්ලේ සඳහන් පරිදි ආබාධිත සහිත පුද්ගලයින්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවට පැහැදිලි වේ.

<u>නිගමනය :</u>

ඉහත සඳහන් කරුණු සියල්ල සළකා බැලීමේදී වගඋත්තරකාර පාර්ශවය නෛතිකමය විධිවිධාන අනුව ක්‍රියා කර නොමැති හේතුවෙන් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) 12(2) සහ 12(4) ව්‍යවස්ථාවන් ප්‍රකාරව සහතික කර ඇති ආබාධ සහිත පුද්ගලයින්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

<u>කොමිෂන් සභාවේ නිර්දේශය :</u>

<u>ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින්,</u>

1. ඉදිරියේදී රාජ්‍ය සේවයේ සහ රාජ්‍ය සංස්ථාවන්හි බඳවා ගැනීමට කටයුතු කිරීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 හි සඳහන් විධිවිධාන දැඩිව අනුගමනය කළ යුතු බවට උපදෙස් ලබා දෙමින් අදාළ චක්‍රලේඛය යාවත්කාලීන කොට සියලුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වෙත නිකුත් කිරීමට කඩිනමින් පියවර ගත යුතුය.

2. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මාර්ගෝපදේශක් නිකුත් කර ඇති අතර ඒ පිළිබඳව චක්‍රලේඛ නිකුත් කරන බවට ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයා වාර්තා කර ඇති අතර එය කඩිනම් කිරීමට කටයුතු කළ යුතු ය.

3. රජය විසින් සහතික කොට ඇති ආබාධිත සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය, 1996 අංක 28 දරණ ආබාධිත සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සහ Weerawansa v. Attorney-General and Others (2000) 1 SLR 387 යන ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව කෙරෙහි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අවධානය යොමු කර සුදුසු පියවර ගත යුතු ය.

2026. 09 . 22 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

දියයුතු වන අතර එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සළකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත : 01 අමාත්‍යතුමා,
කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය,80/5, ගොවිජන මන්දිරය, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

02 ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බත්තරමුල්ල.

03 ලේකම්,
රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
කොළඹ 07.

} ඉහත කරුණු සළකා ආබාධිත ප්‍රජාවගේ රැකියා සුරක්ෂිතතාව සඳහා සුදුසු වැඩපිළිවෙලක් සේවා ව්‍යවස්ථාවට අදාළව ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම සඳහා